# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,221 - 2021 මාර්තු මස 26 වැනි සිකුරාදා - 2021.03.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 482 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 482 |


*සැ. යු.-* (i) සෙත්සඳ යෝගා නිකේතනයේ කාර්යභාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 මාර්තු මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2021 මාර්තු මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 අප්‍රේල් මස 16 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 අප්‍රේල් මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

481 - B 82217 — 5,403 (2021/03)
F 1 -

# පළාත් සභා නිවේදන

**1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනත සමඟ කියැවෙන 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධනය වූ 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 2 (2) උපවගන්තිය යටතේ විශේෂ ආඥාවක් අනුව සිදු කරන බලය පැවරීම**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනත සමඟ කියැවෙන 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධනය වූ 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 2 (2) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවර රාජා කොල්ලුරේ වන මම වයඹ පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර්ට සහය වීමට පත්කර ඇත්තා වූ මීට අමුණා ඇති උපලේඛනයේ I තීරුවෙහි සඳහන් අයට 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධිත වූ 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත හා ඒ යටතේ පනවා ඇති රීති මාලාව යටතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් වෙත පැවරී ඇත්තා වූ එකී උපලේඛනයේ III තීරුවෙහි සඳහන් සියළුම බලතල එකී උපලේඛනයේ II වන තීරුවෙහි සඳහන් දින සිට මෙයින් පවරමි.

රාජා කොල්ලුරේ,<br>
ගරු වයඹ පළාත් ආණ්ඩුකාරවර.

2021 පෙබරවාරි මස 17 වැනි දින,<br>
කුරුණෑගල දී ය.

**උපලේඛනය**

| *I වෙනි තීරුව* | *II වෙනි තීරුව* | *III වෙනි තීරුව* |
|---|---|---|
| රත්නායක පතිරන්නැහෙලාගේ ධනවතී රත්නායක | 2020.12.01 | සමුපකාර සමිති පනතේ 3, 5, 6, 7, 8, 9, 33, 39, 44, [44(6) හැර], 45, 46, 48, 49, 50, 52, 53, 54, 58 [58(3) සහ 58 (5) හැර] 59, 68 සහ 72 යන වගන්ති යටතේ කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයාගේ සියලු බලතල රීති මාලාවේ 4, 11, 15, 16 (ii), 18, 19, 27, 32, 33, 35, 37, 39, 40, 41, 42, 48, 49 [49 (xii) හැර] 51, 52 සහ 53 දරන රීති යටතේ කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයාගේ සියලු බලතල. |

03-758

# විවිධ දැන්වීම්

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

බස්නාහිර පළාත් 2011 අංක 05 දරන බස්නාහිර පළාතේ වෙළඳ, සංස්ථා හා සංස්ථාගත කරනු නොලැබූ වෙළඳ ආයතනයන්හි ව්‍යාපාර නාම ප්‍රඥප්තියේ 20 (4) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

අංක 323, ගාලු පාර, වැල්ලවත්ත, කොළඹ 06 ස්ථානයෙහි මොහමඩ් අජ්මාල් හාජි ඉබ්‍රාහිම් යන අයගේ හිමිකාරිත්වය යටතේ පවත්වාගෙන යාම සඳහා 2006.02.27 දින බස්නාහිර පළාතේ, පළාත් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙහි ඩබ්ලිව්/ඒ 65300 අංකය යටතේ ලියාපදිංචි කර ඇති ඇක්වෝ ලංකා නමැති ව්‍යාපාරය, එම ව්‍යාපාර නාමය යටතේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන නොයන බව විශ්වාස කිරීමට තරම් සාධාරණ හේතු මා වෙත ඉදිරිපත් වී ඇත.

එබැවින්, ඩබ්ලිව්/ඒ 65300 අංකය යටතේ ලියාපදිංචි ඇක්වෝ ලංකා නමැති ව්‍යාපාර නාමය, ව්‍යාපාර නාම ලේඛනයෙන් ඉවත් නොකිරීමට හේතු ඇතොත් ඒ හා සම්බන්ධයෙන් වන විරෝධතා මෙම නිවේදනයට අදාළ දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට මාසයක් ඇතුළත මා වෙත ඉදිරිපත් විය යුතු බවත්, එසේ විරෝධතා ඉදිරිපත් නොවන්නේනම් බස්නාහිර පළාතේ 2011 අංක 05 දරන බස්නාහිර පළාතේ වෙළඳ, සංස්ථා හා සංස්ථාගත කරනු නොලැබූ වෙළඳ ආයතනයන්හි ව්‍යාපාර නාම ප්‍රඥප්තියේ 20 (5) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ඇක්වෝ ලංකා යන ව්‍යාපාර නාමය ව්‍යාපාර නාම ලේඛනයෙන් ඉවත් කරනු ලබන බවත් මෙයින් නිවේදනය කරමි.

ඊ. එම්. අයි. යූ. එදිරිසිංහ,<br>
බස්නාහිර පළාතේ ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්.

2021 මාර්තු මස 08 වැනි දින,<br>
නුගේගොඩ, පාගොඩ පාර, අංක 17හි පිහිටි, බස්නාහිර පළාතේ පළාත් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙහි දී ය.

03-646

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.